අහෝ උමර්! සැබැවින්ම මිනිසාගේ බාප්පා (හෝ මහප්පා) ඔහුගේ පියා මෙන් යැයි ඔබට නොහැඟුණෙහිද?

අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා උමර් -රළියල්ලාහු අන්හු- තුමාව සකාත් සම්බන්ධයෙන් එවූහ. පසුව ඉබ්නු ජමීල්, කාලිද් ඉබ්නු අල් වලීද් හා අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ මහප්පෙකු වූ අබ්බාස් යන අය ඉන් වැළකී සිටි බව කියනු ලැබීය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමා ඉබ්නු ජමීල් ඔහු දිළිඳෙකු වූ බැවින් මිස ඉන් වැළකුණේ නැත. අල්ලාහ් ඔහු ධනවත් කරනු ඇත. කාලිද්(ගේ සකාත්) වනාහි, නියත වශයෙන්ම නුඹලා කාලිද්ට අසාධාරණය කරන්නෙහුය. සැබැවින්ම ඔහු
ඔහුගේ යුද ඇදුම් රඳවාගෙන සිටියි. ඒවා අල්ලාහ්ගේ මාර්ගයේ නිරත කරවීම ඔහු සිරිතක් කරගෙන ඇත. අබ්බාස්(ගේ සකාත්) වනාහි, එය හා එය මෙන් තවත් කොටසක් මා වෙත පැවරී ඇත. පසු එතුමා මෙසේ පවසා සිටියහ. අහෝ උමර්! සැබැවින්ම මිනිසාගේ බාප්පා (හෝ මහප්පා) ඔහුගේ පියා මෙන් යැයි ඔබට නොහැඟුණෙහිද?
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සකාත් රැස් කරනු පිණිස උමර් ඉබ්නු අල් කත්තාබ් - රළියල්ලාහු අන්හු- තුමාව එවූහ.උමර් තුමා අබ්බාස් ඉබ්නු අබ්දුල් මුත්තලිබ් වෙත පැමිණි කල්හි ඔහුගෙන් සකාත් බලාපොරොත්තු විය. නමුත් ඔහු එයින් වැළකුණේය. එසේම කාලිද් ඉබ්නු වලීද් හා ඉබ්නු ජමීල් ද ඉන් වැළකුණෝය. පසුව උමර් තුමා නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා වෙත පැමිණ මේ තිදෙනා පිළිබඳ පැමිණිලි කළහ. එවිට -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- මෙසේ පවසා සිටියහ. ඉබ්නු ජමීල් වනාහි, ඔහු දිළින්දෙකු වූ බැවින් මිස ඉන් වැළකී සිටීමට වෙනත් නිදහසට කරුණක් නොවීය. අල්ලාහ් ඔහුව ධනවත් කරනු ඇත. මෙම ධනාරෝපය ජනයා අතරින් පළමුවැන්නා බවට පිළිගැනීමට ලක් කළේය. කාලිද් වනාහි, සැබැවින්ම ඔබ සකාත් දීමෙන් වැළකී ඇතැයි කරන ප්රකාශය තුළින් ඔහුට අසාධාරණය කර ඇත්තෙහුය. ඔහු ඔහුගේ යුද ඇඳුම් ගබඩා කර ගෙන එය අල්ලාහ්ගේ මාර්ගයේ යොදවයි. මිනිසෙකු සකාතයෙන් වැළකී සිටිය හැක්කේ කෙසේද? ඔහු අල්ලාහ්ට සමීප වීමක් වශයෙන් තමන් වෙත අනිවාර්යය නොවූ දෙයක් වියදම් කරමින් පසුව අල්ලාහ් නියම කළ දෙයකින් වැළකී සිටියි. සැබැවින්ම එය දුරස්ය. තවද අබ්බාස් වනාහි, එතුමාගේ සකාතය සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා භාරගත්හ. එය එතුමාගේ ස්ථානයේ හා නිලයේ ඔහු යන අර්ථය උසුලා ඇත. එම ප්රකාශයට සාධක වශයෙන් “සැබැවින්ම මිනිසාගේ බාප්පා (හෝ මහප්පා) ඔහුගේ පියා මෙන් යැයි ඔබට නොහැඟුණෙහිද?“ සඳහන්ව ඇත. තය්සීරු අල් අල්ලාම් (1/304) තන්බීහුල් අෆ්හාම් (399) තඃසීසුල් අහ්කාම් හදීස් විග්රහය: (අංක 173)

http://www.sunnah.global/hadeeth/si/show/4450